**කළුගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (1) - 2024**

---

කළුගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 1 හි 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2017 ජූලි 07 දින එළඹි අංක එස්එල්-පී 117 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති සංදේශයේ 19 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කළුගඟ ජල සම්පාදන පහසුකම් පුළුල් කිරීම සහ ජල බෙදා හැරීමේ ජාල ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් බස්නාහිර පළාතේ දකුණු ප්‍රදේශයේ ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ ජල සම්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, එමඟින් එහි ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට දායක වීම වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 55,338 ට සමාන ජපන් යෙන් මිලියන 39,067 ක් වූ අතර එයින් රු. මිලියන 45,056 ට සමාන ජපන් යෙන් මිලියන 31,810 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි රු. මිලියන 10,282 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි ක්‍රියාකාරකම් 2020 දෙසැම්බර් මාසයේදී ආරම්භ කළ අතර 2025 අප්‍රේල් මාසය වන විට නිම කිරීමට සැලසුම් කර ඇත. 2024 ජූලි 24 වන දින සිට ජපාන රජය විසින් අරමුදල් නැවත ලබාදීමත් සමඟ, ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කරන ලද අතර සංශෝධිත ක්‍රියාත්මක කිරීමේ කාලසටහනකට අනුව 2028 ඔක්තෝබර් මාසයේදී වැඩ නිම කිරීමට තීරණය කරන ලදී.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# 2. භෞතික කාර්යසාධනය

## 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත් පැකේජ පහක් සහ උපදේශන කොන්ත්‍රාත්තුවෙන් සමන්විත ව්‍යාපෘති ක්‍රියාකාරකම් 2020 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර මාස 65ක් ඇතුළත අවසන් කිරීමට මුලින් සැලසුම් කර තිබුණි. මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශයකින් පසුව, ව්‍යාපෘති සහ ව්‍යාපෘති කාර්යාල කටයුතු 2022 ඔක්තෝබර් 28 වන දින තාවකාලිකව අත්හිටුවන ලදී. 2024 ජූලි 24 වන දින ජපාන රජය විසින් අරමුදල් ලබාදීම නැවත ආරම්භ කිරීමත් සමඟ ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කරන ලදී. සංශෝධිත සැලැස්මට අනුව

ව්‍යාපෘතිය 2028 ඔක්තෝබර් මාසයේදී අවසන් වන අතර උපදේශන කොන්ත්‍රාත්තුව පමණක් 2024 දී ආරම්භ කිරීමට නියමිතව තිබුණි. ප්‍රගති වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ උපදේශන සේවා ක්‍රියාකාරකම් සඳහා සියයට 63 ක ඉලක්කයක් ලඟා කරගෙන තිබුණි.

## 2.2 ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට අදාළ ගැටළුව

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති නිලධාරීන්ට නිශ්චිත වගකීම් පැවරීම සහ ඔවුන්ගේ භූමිකාවන් ඉටු කිරීම නිරීක්ෂණය කිරීම සඳහා කාර්ය සාධන දර්ශක සංවර්ධනය කිරීම අවශ්‍ය වුවද, එවැනි කාර්ය සාධන දර්ශක සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, කාලීනව තනි තනි වගකීම්වල ප්‍රගතිය මැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වී නොතිබුණි. | ව්‍යාපෘති කාර්යාලය නැවත ස්ථාපිත කිරීමෙන් සහ ව්‍යාපෘතිය සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් පත් කිරීමෙන් පසු, කාර්ය සාධන දර්ශක සහ කාර්ය මණ්ඩල රාජකාරි සංවර්ධනය කරනු ලබයි. | ව්‍යාපෘති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය. |